# විමර්ශි 35

## අවතැන් ජනයා සිර ගෙයකින්, සිර ගෙයකට

අවතැන් ජනතාව ඔවුන්ගේ ගම්බිම්වල යළි පදිංචි කිරීම ඉක්මන් කරන්නැයි ඉල්ලමින් අන්තර්ජාතික ප්‍රජාවගෙන් මෙන්ම දේශීය වශයෙන්ද රජයට කෙරෙන බලපෑම් ගැන රජය නොසතුටට පත්වී ඇති ආකාරය පසුගිය දිනවල මාධ්‍ය නිරීක්ෂණය කිරීමේදී දක්නට ලැබිණ. ඉවත් කළ බිම් බෝම්බ ගොඩක දර්ශනයක්, ගෙන්වූ නවීන උපකරණ හා බිම් බෝම්බ ඉවත් කරන දර්ශන නිරන්තරයෙන් පෙන්වමින් විශේෂයෙන් රජයේ මාධ්‍ය හරහා අවධාරණය කරන්නේ නැවත පදිංචි කිරීමට බිම් බෝම්බ බාධාවක් වී ඇති බවයි. ජාත්‍යන්තර ප්‍රජාව හෝ වෙනත් කිසිවකු හෝ කියන පලියට ජනතාව අනතුරට පත් කළ නොහැකි බව මෙන්ම ඔවුන්ට අවශ්‍ය යටිතල පහසුකම් සම්පූර්ණ කර යැවිය යුතු බව රජයේ බලධාරීහු ප්‍රකාශ කරති. පදිංචි කිරීම ගැන අදහස් ප්‍රකාශ කරන අයට වාග් ප්‍රහාර එල්ල කරති. ඒ අතරම යුද උගුල් ඇටවූ ප්‍රදේශවල නොව අවසන් මොහොතේ පළා එනතෙක් ජනතාව ජීවත් වූ නිවාස අවට නිරවුල් කර ජනතාව පදිංචි කිරීමට හැකි බවටත්, බෝම්බ ගැන කියමින් රජය අවතැන් වූවන් යළි පදිංචි කිරීම ප්‍රමාද කරන බවටත් අනෙක් පාර්ශ්ව චෝදනා කරන ආකාරයද මාධ්‍ය මඟින් දකින්නට ලැබේ. එමෙන්ම එක්සත් ජාතීන්ගේ නියෝජිතයකු පසුගිය දා මෙරටට පැමිණීමත්, ජිනීවාහී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කොමිසමේ 12වන සැසිවාරය පැවැත්වීමත් නිසා අවතැන් වූවන් නැවත පදිංචි කිරීම සම්බන්ධයෙන් යටපත් වූ හඬ මතු වන බවක් පෙනිණ. එහෙයින් මෙවර අපගේ මාධ්‍ය නිරීක්ෂණය ඒ සඳහා යොමු විය.

2009 සැප්තැම්බර් 14 සිට 20 දක්වා, සෙනසුරාදා හැර දින හයක කාලය තුළ, මාධ්‍යවල පළ වූ වාර්තා ප්‍රමාණයට වඩා අපගේ අවධානය යොමු වූයේ මතුවූ කාරණා සම්බන්ධයෙනි. වාර්තා වශයෙන් මේ සම්බන්ධයෙන් සිංහල පුවත්පත්වල පළ වී තිබුණේ 11කි. එයින් වාර්තා 5ක්ම අයත් වන්නේ රජයේ මාධ්‍ය පුවත්පතටය (දිනමිණ). නමුත් මෙම වැඩි සංඛ්‍යා ප්‍රමාණයෙන් වාර්තා වී ඇත්තේ අවතැන් ජනයා අවස්ථා කිහිපයකදී යළි පදිංචි කර ඇති බවයි. එක් පුවතකට අනුව අවතැන් වූවන් 45,000ක් අදියර 4කින් උතුරේ පදිංචි කර අවසන්ය. අවතැන් ජනයාගේ ජීවිත අවදානමකට ඇද නොදමා සැලැස්මක් ඇතිව පදිංචි කරන බවට කළ රජයේ බලධාරියකුගේ ප්‍රකාශයක්ද වෙයි. යුද්ධය සහ අවතැන් දෙමළ ජනතාව සම්බන්ධයෙන් රජයේ මතය හා සමගාමී තවත් පුවත්පතක් (දිවයින) පළ කර ඇත්තේද අවතැන් වූවන් යළි පදිංචි කිරීමට අදාල පුවතකි. තවත් පුවත්පත් හතරක (ලංකාදීප, ඉරිදා ලංකාදීප, රාවය, ඉරුදින) අවතැන් ජනයා සම්බන්ධ ඉතිරි පුවත්/කතුවැකි 6 පළ වී තිබිණ. තමන්ගේ ගම්බිම්වලට යානොදී ත්‍රස්තවාදීන් ලෙස අවතැන් ජනතාව රඳවා තබා ගැනීම, අවතැන් වූවන් නැවත පදිංචි කිරීම සම්බන්ධයෙන් රජයේ මන්දගාමී පිළිවෙත, දින 180කින් අවතැන් ජනයාගෙන් සියයට 80ක් යළි පදිංචි කරන බවට දුන් පොරොන්දුව නොතකා හැරීම, 40000ක් පදිංචි කළ බවට පළ වන වාර්තාවල සත්‍යතාවක් නැති බව වැනි කරුණු එම පුවත්පත්වල පළවූ පුවත්/විශේෂාංගවලට ඇතුළත් වී තිබිණ. ''දයා මාස්ටර්ගෙන්, ජෝර්ජ් මාස්ටර්ගෙන් ආරක්ෂාවට තර්ජනයක් නැත්නම් සරණාගත කඳවුරුවල සිටින අසරණයන්ගෙන් ඇති තර්ජනය කුමක්ද - විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ'' වැනි සිරස්තල ඒ අතර විය. තවත් විවිධ මූලාශ්‍ර භාවිතා කොට තිබිණ. කෙසේ වුවත් මෙම පුවත් කිහිපයෙන් අවතැන් වූවන් ගත කරන බේදනීය සිරගත ජීවිතය හා රජය ඔවුන් නිදහස් කිරීමට ගන්නා පියවර ගැන නොසතුට මේවායින් ප්‍රකාශ වීම නිසා මානුෂීය පුවත් වාර්තාකරණයේ සාධනීය අවස්ථාවක් ලෙස ගත හැකිය.

මුල් ගම්බිම්වල යළි පදිංචි කළ අවතැන් පුද්ගලයන්ගේ සංඛ්‍යා ලේඛණ ඇතුළත් පුවත් වාර්තා කිහිපයක් මෙන්ම, එසේ පදිංචි කළ බව කියන පුද්ගලයන් නැවතත් පදිංචි කර ඇත්තේද අලුත් කඳවුරුවල බව අනාවරණය කරන විශේෂ පුවත් කිහිපයක් ඇතුළු පුවත්/විශේෂාංග 14ක් ඉංග්‍රීසි මාධ්‍ය පුවත්පත්වල පළ වී තිබුණි. පුවත් සංඛ්‍යාවේදී වැඩි වාර්තා ගණන අයත් වන්නේ සිංහල පුවත්පත්වලදී මෙන්ම රජයේ මාධ්‍ය පුවත්පත් දෙකටය (ඩේලි නිවුස්, ඔබ්සර්වර්). එය ගණනින් 8කි. ඒ අතර ප්‍රධාන සිරස්තල 2ක් හා කතුවැකියක්ද වේ. නැවත පදිංචි කිරීමේ ප්‍රගතිය, නැවත පදිංචි කිරීම් ගැන අවධාරණය කරන්නන් වෙනුවෙන් රජයේ බලධාරීන් කළ ප්‍රකාශ ආදී සිංහල වාර්තාකරණය සමාන කරුණු ඒවායේද අන්තර්ගතය. මෙහිදී මානුෂවාදී පුවත් වාර්තාකරණයේ

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com

කරුණු අනාවරණය කිරීම අතින් ඉතා වැදගත් පුවත් 3ක් පුවත්පත් තුනක (ඩේලි මිරර්, සන්ඩේ ලීඩර්, සන්ඩේ ටයිම්ස්) පළ වී තිබීම විශේෂය. මෙම පුවත්වලින් අනාවරණය කරන්නේ ඒ වන විට මාධ්‍යවලින් හෙළිදරව් නොවුණත් සිවිල් සමාජයේ සංවේදී කොටසක් කණස්සල්ලට පත් වී සිටි කාරණයකි. එය මහජනයාට රහසක් වී තිබූ කාරණයකි. වව්නියාවේ කඳවුරුවල සිටි මේ පිරිස් මුල් ගම්බිම්වල පදිංචියට යැවීම උත්සවාකාරයෙන් සිදු කළ ආකාරය රූපවාහිනී මාධ්‍ය මඟින්ද දක්නට ලැබිණ. බොහෝ වාර්තාවලින් සාමාන්‍ය මහජනයා වටහා ගන්නේ, යුද කළාපය තුළ සිරවී සිට ආරක්ෂා හමුදා වෙත භාරවූ තමන් රූපවාහිනී මාධ්‍ය මඟින්ද දුටු කිලිනොච්චි, මුලතිව් දිස්ත්‍රික්කවල ජනතාවගෙන් කොටසක් මාස තුනක් ඇතුළත මුල් ගම්බිම්වල පදිංචි කිරීම ආරම්භ කර ඇති බවයි. නමුත්, වව්නියාවේ අවතැන් කඳවුරුවල දීර්ඝ කාලයක් තිස්සේ සිටි, යාපනය, මඩකලපුව, ත්‍රිකුණාමලය සහ අම්පාර වැනි ප්‍රදේශවලට අයත් අවතැන් වූවන් අදියර කිහිපයකින් මුල් ගම්බිම්වල පදිංචියට යැවූ ආකාරය ගැන වැටහෙන්නේ මෙම සතියේ වාර්තා කිහිපයක් හොඳින් නිරීක්ෂණයේදීය. මෙහි ප්‍රධානම විශේෂත්වය වන්නේ මුල් ගම්බිම්වල පදිංචි කරනවායැයි ප්‍රකාශ කරමින් පිට කළ ජනතාව නැවතත් පදිංචි කර ඇත්තේ එම දිස්ත්‍රික්කවල අළුත් කඳවුරුවල බව හෙළි කිරීමයි. පුවත් තුනට අදාල සංඛ්‍යාවල පරස්පරයන් ඇතත් මූලික වශයෙන් අවතැන් ජනයාගෙන් වැඩි කොටසක් නැවතත් අවතැන් කඳවුරුවල සිරගත වන ආකාරයක් අනාවරණය වෙයි. එක් පුවතකට අනුව, (ඩේලි මිරර්) වව්නියාවේ කඳවුරෙන් නිදහස් කළ පවුල් 123ක් මඩකළපුවේ පාසල් දෙකක කඳවුරුගත කොට ඇත. දෙමළ ජාතික සන්ධානයේ ලේකම් මාවෙයි සේනාධිරාජා මූලාශ්‍ර කොට ගත් තවත් පුවතකින් (සන්ඩේ ලීඩර්) හෙළි වන්නේ පසුගිය දිනවල දහ දාහක කණ්ඩායමක් වව්නියාවේ කඳවුරෙන් නිදහස් කළ බව රජය ප්‍රකාශ කළත් ඔවුන් යොමු කර ඇත්තේ යාපනය, අම්පාර, ත්‍රිකුණාමලය වැනි ප්‍රදේශවල අලුත් අවතැන් කඳවුරු වෙත බවයි. එය විශාල රැවටීමක් බව සේනාධිරාජා මහතා ප්‍රකාශ කර ඇත. එම අනාවරණය ගැන තහවුරු කර ගැනීමට ආපදා සහන සේවා සහ නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ ලේකම් යූ.එල්.එම් හලාල්දීන් මහතාගෙන් පුවත්පත විමසීමක් කළ විට තමා ඒ ගැන නොදන්නා බව ප්‍රකාශ කර ඇත. බස් රථවලින් ගෙන ගොස් අදාල ප්‍රදේශවල රජයේ නිලධාරීන්ට භාර දීම තමන්ගේ වගකීම වන අතර එයින් පසු ගන්නා ක්‍රියා මාර්ග ගැන **නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය** නොදන්නා බව එයින් ප්‍රකාශ වේ. අනෙක් වාර්තාවටද (සන්ඩේ ටයිම්ස්) ඇතුළත් වන්නේ ඉහත පුවතට සමාන ආකාරයේ අනාවරණයකි. එහි මූලාශ්‍රය එක්සත් ජාතීන්ගේ මානුෂවාදී කටයුතු සම්බන්ධ සම්බන්ධීකරණ කාර්යාලය නිකුත් කළ වාර්තාවකි. මේ සම්බන්ධයෙන්ද කරුණු පැහැදිලි කර ගැනීමට විමසූ විට ඉහත කී අමාත්‍යාංශ ලේකම්වරයා දී ඇත්තේ සමාන පිළිතුරකි.

නැවත පදිංචි කිරීමේ තොරතුරුවලට අදාල දෙමළ පුවත්පත් වාර්තාකරණය සංඛ්‍යාත්මක අතින් අනෙක් සියළුම මාධ්‍යයට වඩා ඉදිරියෙන් සිටී. සංඛ්‍යාත්මකව වාර්තා 48කි. ප්‍රධාන සිරස්තල 3ක්ද ඒ අතර වෙයි. රජයේ මාධ්‍ය පුවත්පත (තිනකරන්) එක් ප්‍රධාන සිරස්තලයක්ද සහිතව අනෙක් රජයේ මාධ්‍යයට සමාන ආකාරයෙන් වාර්තා කර ඇති අතර වාර්තාද හයකි. අනෙක් පෞද්ගලික පුවත්පත් තුන (සුඩර් ඔලි, වීරකේසරී, තිනක්කුරල්) අවතැන් වූවන් යළි ඉක්මනින් මුල් ගම්බිම්වල පදිංචි කරන බව අවධාරණය කරන රජයේ මූලාශ්‍ර ඇසුරෙන්ද වැඩි වාර්තාකරණයක යෙදෙයි. යළි පදිංචි කිරීමේ මාතෘකාව ඉදිරියට ගෙන ඒමේ අරමුණ මෙන්ම අවතැන් දෙමළ ජනයාට ඇති පක්ෂපාතිත්වයද පෙන්වමින්, යළි පදිංචි කිරීම ඉක්මන් කිරීම සහ අවතැන් වූවන්ගේ මූලික අයිතීන් ආරක්ෂා කිරීම සඳහා කෙරෙන ජාත්‍යන්තර බලපෑම් අනාවරණය කරන ප්‍රකාශ කිහිපයක් පළ කර ඇත. මෝසම් වැස්සට පෙර අවතැන් වූවන් ගම්බිම්වල පදිංචි කිරීමේ අවධාරණයද වාර්තා අතර පැහැදිලිය. එමෙන්ම දින 180 පොරොන්දුව ක්‍රියාත්මක කළ යුතු බව සිහිපත් කරන වාර්තාද වෙයි. දෙමළ පුවත්පත් අතරද ඉහත කී ඉංග්‍රීසි පුවත්පත් අනාවරණය කළ යළි පදිංචි කිරීමේ මුවාවෙන් කරන රැවටීම හෙළි කරන පුවත් කිහිපයක් වෙයි. මාවෙයි සේනාධිරාජා මූලාශ්‍ර කර ගත් පුවතද ඒ අතර වේ. එහි විස්තර වන ආකාරයට, සතියකට පෙර 6000ක් යළි පදිංචි කළ බව ප්‍රකාශ කළත් ගෙන ගොස් ඇත්තේ 580කි. ඔවුන්ද ගෙන ගොස් ඇත්තේ වෙනත් කඳවුරකටය. මෙය සිර ගෙයකින් සිර ගෙයකට මාරු කිරීමක් බව සේනාධිරාජා ප්‍රකාශ කර ඇත. අවතැන් වූවන් මුල් ගම් බිම්වල නොව වෙනත් කඳවුරුවල පදිංචි කිරීම තහවුරු කර ගැනීමට හැකි තවත් පුවතක් (තිනක්කුරල්) රජයේ නිලධාරියකු මූලාශ්‍ර කර ගෙන පළ කර ඇත. ඒ අනුව සැප්තැම්බර් 14 යාපනයට ගෙන ආ 505කින් 179ක් පමණක් වේලනෙයි ප්‍රදේශයේ පදිංචි කොට ඇත. එමෙන්ම 367 දෙනෙකු ගෙන ගොස් මඩකළපුවේ සිංහල මහා විද්‍යාලයේ කඳවුරට යොමු කර ඇති බව, බස් හතරකින්

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com

අම්පාරට ගෙන ගිය 130 දෙනෙක් පොලිස් බුද්ධි අංශවල, ප්‍රදේශීය ලේකම් සහ ග්‍රාම සේවකගේ පරීක්ෂණවලින් පසු කාරතිව් විපුලානන්ද පාසලට දැමූ බවත් පසුව ඔවුන් අක්කරෙයිපත්තු හමුදා කඳවුර ඉදිරිපිට පාසලකට දමා(ඔවුන් පාසල පටන් ගන්නට පෙර වී ගබඩාවකට යවන බවත් පාසල අවසන් වූ පසු නැවත පාසලට එවන බවත් සඳහන් වේ)  ඇති බවත් ඇතුළු අවතැන් වූවන්ගේ ඉරණම සම්බන්ධ ඛේදනීය සිදුවීම් ගණනාවක් මේ වාර්තාවලට ඇතුළත්ය. දෙමළ පුවත්පත්වල සිදුවීම් වාර්තා වුවත් ඒවායේ කැපී පෙනෙන වෘත්තීයමයභාවයේ අඩු පාඩුකම් නිසා ප්‍රබලත්වය මතුවීම අඩුය. ඉංග්‍රීසි පුවත්පත් දෙකක් මාවෙයි සේනාධිරාජාගේ ප්‍රකාශය තහවුරු කර ගැනීමට අදාල රාජ්‍ය අංශයේ නිලධාරියා මූලාශ්‍රයක් ලෙස භාවිතා කිරීම නිසා ඔහු දුන් පිළිතුරෙන් සිදුවීමේ සත්‍යතාව වටහා ගැනීමට හැකිය. රැවටීමක් සිදු වන බවට අදහසක් ලබා ගත හැකිය. දෙමළ මාධ්‍ය වැඩි පුවත් ප්‍රමාණයක් ඉදිරිපත් කළත්, ඒ හරහා අනෙක් මාධ්‍යයට වඩා වෙනස් සිදුවීම් අනාවරණය වුවත් ඒවා නිරවුල් කර ගැනීමට හැකි මූලාශ්‍ර භාවිතා නොකරණ හෙයින් ප්‍රබලත්වය අඩු කර ගනී.

රූපවාහිනී වර්තා මඟින් ඉහත කී ඉංග්‍රීසි සහ දෙමළ පුවත්පත්වලින් කෙරුණු අනාවරණයන්ට අදාල පුවත් විකාශනය වූයේ නැත. ජාතික රූපවාහිනිය, ස්වාධීන රූපවාහිනිය යන රජයේ රූපවාහිනී සේවාවලින් අවතැන් වූවන් යළි පදිංචියට බාධාකාරී බෝම්බ ඉවත් කිරීම්වලට අදාල පුවත්/වාර්තා (ඒවා නොතකා පදිංචි කිරීම් ඉක්මන් කිරීමට ප්‍රකාශ කරනවායැයි කියන ජාත්‍යන්තර සහ දේශීය පුද්ගලයන්ට ප්‍රහාර සහිතව) නැවත නැවත විකාශනය කළ අතර යළි පදිංචි කිරීමට පුද්ගලයන් යැවීමට අදාල පුවත් 8ක් පමණ විකාශනය කර තිබිණ. දෙරණ රූපවාහිනියද පුවත් දෙකක් එයට අදාලව විකාශනය කළේය. සිරස මාධ්‍ය ජාලය එකම පුවත දෙවරකදී වෙනස් ආකාරයට ඉදිරිපත් කර තිබිණ. එයින් ඒ දිස්ත්‍රික්කවලට යළි පදිංචිය සඳහා යැවීමට නිදහස් කළ අවතැන් වූවන්ගේ සංඛ්‍යා දක්වා තිබිණ.

කෙසේ වුවත් ඒ ඒ මාධ්‍යවල යළි පදිංචි කළ බවට සඳහන් සංඛ්‍යා දැක්වීම් වෙනස් වුවත් බරපතලම කාරණය එසේ පදිංචි වූවන් සැබවින්ම නිදහසේ තම ගම්බිම්වලට යනවාද යන කාරණයයි. ඉංග්‍රීසි හා දෙමළ පුවත්පත් වාර්තා කිහිපයකින්ම තරමක් දුරට මෙවර අනාවරණය වූයේ සමාජයේ සංවේදී මිනිසුන් කණස්සල්ලට පත් කරමින් පැතිර තිබූ ආරංචියේ ස්වරූපයයි. එම බොහෝ වාර්තාවලට අනුව නම් වව්නියාව කඳවුරෙන් නිදහස්ව තමන්ගේ පළාතට ගොස් යළිත් දැඩි පරීක්ෂාවලින් පසුව පත්වන්නේද රඳවා තබා ගැනීමකටයි. මාවෙයි සේනාධිරාජා කියා ඇති පරිදි සිදුවන්නේ සිර ගෙයකින් සිර ගෙයකට අවතැන් ජනයා මාරු කිරීමයි.

**සීතා රංජනී**

**seetharanjanee@gmail.com**
**seetha@cpalanka.org**

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com